(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(14).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 ඔක්තෝබර් 24 සිකුරාදා**

---

**2025 නොවැම්බර් 07 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 20 දිනැති අංක 2454/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 18(3) වගන්තියේ (ඊ) ඡේදය සමඟ කියවිය යුතු 50 වගන්තිය යටතේ ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි සම්බන්ධයෙන් බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 26 දිනැති අංක 2451/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රුහුණු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2022),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2024.12.17 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රුහුණු විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.07 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2022),— 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.07 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2022),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2025.02.18 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.08.06 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.07 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2023),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස යටතේ 2025.02.22 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.08.06 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2022),— 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනතේ 19 වගන්තිය යටතේ 2024.07.23 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.08.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2022.01.20 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.02.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.02.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.01.20 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020),— 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2025.02.20 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ VI වන කොටසේ 29 වගන්තිය යටතේ 2025.05.09 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.08.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව (2022),— 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 31 වගන්තිය යටතේ 2024.12.18 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික තරුණ සේවා සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තරුණ කටයුතු සහ ක්‍රීඩා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.06.13 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.06.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10(8) වගන්තිය යටතේ 2023.12.01 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.05.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10(8) වගන්තිය යටතේ 2025.03.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.05.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 32 වගන්තිය යටතේ 2024.07.23 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 32 වගන්තිය යටතේ 2025.04.09 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2025 නොවැම්බර් 08 සෙනසුරාදා)**

1462/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බණ්ඩාරගම පිහිටි, කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ (පෙර රාජා සමරනායක ස්ටේඩියම්) නඩත්තුව සහ ප්‍රතිසංස්කරණය සඳහා සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රීඩා සංකීර්ණයේ සිදු කළ යුතු නඩත්තු කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

(iv) එම ක්‍රීඩා සංකීර්ණයේ නඩත්තු කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් 2025 වර්ෂය තුළ වැය කර ඇති මුදල කොපමණද;

(v) එම ක්‍රීඩාංගනයේ ඇති මීටර් 400 ධාවන පථයේ, මීටර් 100ක පමණ කොටසක සහ ක්‍රීඩාංගනය මධ්‍යයේ ස්ථාන ගණනාවක තණකොළ මැරී ගොස් බොරලු පස් පෑදී ඇති බව දන්නේද;

(vi) එසේ නම්, එය විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(vii) ක්‍රීඩාංගනය තුළ වැසි ජලය එකතුවීම වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 20 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

680/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ගල් අඟුරු දහනය හේතුවෙන් ඒ අවට ගම්මානවල පදිංචි වී සිටින ජනතාව පාරිසරික ගැටලු රාශියකට මුහුණදී සිටින බව දන්නේද;

(ii) එම පාරිසරික ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

740/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කර, නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට සහ ශක්‍යතා අධ්‍යයනය සඳහා මේ වනවිට වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ව්‍යාපෘතිය මේ වනවිට ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(v) එසේ නම්, එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

812/2025

ගරු මුජිබූර් රහුමාන් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල පවතින තදබදය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා අවසන් වරට කමිටුවක් පත් කරන ලද දිනය කවරේද;

(ii) එම කමිටුවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) බන්ධනාගාරවල පවතින තදබදය අවම කිරීම සඳහා එම කමිටුව විසින් ලබා දෙන ලද නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1011/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලිසියට වාර්තාවී ඇති මුළු සයිබර් මූල්‍ය අපරාධ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා උතුරු පළාත තුළ ශ්‍රී ලංකා පොලිසියට වාර්තාවී ඇති මුළු සයිබර් මූල්‍ය අපරාධ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උතුරු පළාතේ සෑම දිස්ත්‍රික්කයකම නිල සයිබර් අපරාධ වාර්තා කිරීමේ වේදිකා හෝ පොලිස් සයිබර් අපරාධ ඒකක හරහා ලැබුණු අන්තර්ජාල බැංකු වංචා, තතු බෑම (Phishing) සහ අනවසර විද්‍යුත් අරමුදල් හුවමාරු කිරීම් වැනි මූල්‍ය වංචාවලට අදාළ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ග්‍රාමීය හා අවම පහසුකම් සහිත ප්‍රදේශවල, විශේෂයෙන්ම උතුරු පළාතේ සිදුවන සයිබර් මූල්‍ය අපරාධ පිළිබඳව වාර්තා කිරීමට මහජනතාවට ඇති ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1300/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව ස්ථාපිත කිරීමට යෝජිත අධ්‍යාපන සභාව සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කර ඇති කමිටු සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) එම කමිටුවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 21 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1086/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය විසින් වවුනියා දිස්ත්‍රික්කයේ ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා 2015 වර්ෂයේදී යෝජනාවක් ඉදිරිපත් කරන ලද බවත්;

(ii) ඒ අනුව රු.මි. 263ක් වියදම් කර කඩකාමර 52කින් යුත් ආර්ථික මධ්‍යස්ථානයක් වවුනියාව-මහනුවර ප්‍රධාන මාර්ගයේ මදගුවෛත්තකුලම්හි 2018 වර්ෂයේදී ඉදිකරන ලද බවත්;

(iii) ඉදිකිරීමෙන් පසුව වර්ෂ 7ක් ගතවී ඇතත් මේ දක්වා එය විවෘත කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

(iii) එහි ඇති කඩකාමර 52 බෙදා දෙන පදනම කවරේද;

(iv) මේ වනවිට තොග එළවළු වෙළඳාමේ නිරතවී සිටින වෙළඳුන්ට ඉහත කඩකාමර ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1102/2025

ගරු සුරංග රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2025.01.01 දින වනවිට ශ්‍රී ලංකාවේ රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්තමාන රජය විසින් උපාධිධාරීන්ට ලබාදී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) එම රැකියා සංඛ්‍යාව එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ඉදිරි වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පවතින රජයේ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1305/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2020 සිට 2025 දක්වා —

(i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ඇති කුණ්ඩසාලේ, මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ ගව ශුක්‍රාණු ලබා ගැනීමට භාවිතා කරන ලද පිරිමි ගවයන් සංඛ්‍යාව;

(ii) ඉහත මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරන ලද ගව ශුක්‍රාණු ප්‍රමාණය සහ ආනයනය කරන ලද ගව ශුක්‍රාණු ප්‍රමාණය;

(iii) එම මධ්‍යස්ථානයේ කෘත්‍රිම සිංචනය මඟින් බිහිවී ඇති ගව පැටවුන් සංඛ්‍යාව;

(iv) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පිරිමි ගවයන් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අභිජනනය සඳහා ශුක්‍රාණු ලබා ගැනීමට පිරිමි ගවයන් ආනයනය කිරීම වෙනුවට ගව ශුක්‍රාණු ආනයනය කිරීමේ වාසි කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1362/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව්, මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල සිද්ධ වෛද්‍ය සේවාව සපයන වෛද්‍ය මධ්‍යස්ථාන එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වෛද්‍ය මධ්‍යස්ථානවල අනුමත සේවක සංඛ්‍යාව අනුව, දේශීය වෛද්‍යවරුන් සඳහා දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත දිස්ත්‍රික්ක තුනෙහි දේශීය වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බවත්, උතුරු පළාතේ අනෙකුත් ප්‍රදේශවල දේශීය වෛද්‍යවරුන්ගේ අතිරික්තයක් පවතින බවත් දන්නේද;

(iv) එසේ නම්, වන්නි දිස්ත්‍රික්කයේ ජනතාවට දේශීය වෛද්‍ය සේවාව විධිමත්ව ලබා ගත හැකි වන පරිදි දේශීය වෛද්‍යවරුන් සඳහා පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

(v) නව පත්වීම් ලබා දෙන තෙක් පුරප්පාඩු වැඩි වශයෙන් පවතින ඉහත දිස්ත්‍රික්කවලට අනෙකුත් ප්‍රදේශවල අතිරික්තව සිටින වෛද්‍යවරුන්ට කඩිනමින් ස්ථාන මාරු ලබා දී වෛද්‍ය වෘත්තික ව්‍යාප්තිය විධිමත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේනම්, ඒ මන්ද?

1468/2025

ගරු චානක මාදුගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂයට අදාළ අයවැය යටතේ විශේෂිත ක්‍රීඩා පාසැල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දකුණු පළාත තෝරා නොගැනීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂයට අදාළ අයවැය මඟින් වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) 2025 අගෝස්තු මාසය වනවිට ඉහත මුදලෙන් වියදම් කර ඇති මුදල කොපමණද;

(iv) විශේෂිත ක්‍රීඩා පාසැල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පළාත් පහක් පමණක් තෝරා ගැනීමේ පදනම කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 22 සෙනසුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1116/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රේඛීය අමාත්‍යාංශය විසින් පාලනය කරනු ලබන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති රජයේ රෝහල් කවරේද;

(ii) ත්‍රිකුණාමලය මූලික රෝහල සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

(iii) කාර්යක්ෂම සේවයක් සැපයීමට බාධාවක් වී ඇති බවට හඳුනාගෙන ඇති කන්තලේ රෝහලේ පවතින ගැටලු කවරේද;

(iv) එම ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1180/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිළිනොච්චි නගර මධ්‍යයේ සතොස වෙළෙඳසැල පිහිටුවා ඇති ගොඩනැගිල්ල නිසි අනුමතියකින් තොරව ඉදිකර ඇති බව දන්නේද;

(ii) ඉදිකිරීම් සඳහා අදාළ අනුමතිය කරෙයිච්චි ප්‍රාදේශීය සභාවෙන් නිසි පරිදි ලබා ගෙන තිබේද;

(iii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රජයේ මුදල් වැය කර තිබේ නම්, ඒ සඳහා මිල ගණන් කැඳවන ලද විස්තර කවරේද;

(iv) ඉදිකිරීම් සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියනවලින් කොපමණද;

(v) ඉහත ගොඩනැගිල්ලේ වර්තමාන හිමිකරු කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ල පිහිටුවා ඇති භූමියේ හිමිකාරිත්වය සතු ආයතනය කවරේද;

(ii) එම ඉඩම දීර්ඝ කාලීන බදු පදනම මත යම් පාර්ශ්වයකට ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

1316/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව සහ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු සඳහා නව නිලධාරීන් බඳවා ගන්නේද;

(iii) මේ වනවිට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වර්ෂ ගණනාවක සිට එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ සේවය කරනු ලබන බව දන්නේද;

(iv) ඔවුන්ට වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ස්ථාන මාරුවීම් ලබා දිය හැකිද;

(v) පසුගිය කාලයේදී වවුනියාව දිස්ත්‍රික්කයේ සමෘද්ධි සංවර්ධන නිලධාරි පත්වීම් දේශපාලන පදනම මත ලබාදී ඇති බව දන්නේද;

(vi) ඒ හේතුවෙන් එම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට ස්ථාන මාරුවීම් ලබා දීමට නොහැකි තත්ත්වයක් උදාවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මූල්‍ය වංචා සිදු කිරීම හේතුවෙන් වවුනියාව දිස්ත්‍රික්කයේ සමහර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට එරෙහිව අභ්‍යන්තර පරීක්ෂණ පවත්වන බව දන්නේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණවල වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1429/2025

ගරු තිළිණ සමරකෝන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා ටයර් සහ ටියුබ් මිලදී ගනු ලබන ආයතනය කවරේද;

(ii) එම ආයතනයේ සැපයුම් ධාරිතාවය ප්‍රමාණවත් වන්නේද;

(iii) ටයර් සහ ටියුබ් සැපයීම සඳහා ලබා දෙන ටෙන්ඩර් කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා මිලදී ගනු ලබන ටයර් සහ ටියුබ්වල ප්‍රමිතිය කවරේද;

(ii) දුෂ්කරතාවයකින් තොරව ගමනාන්තය කරා ලඟා වීම සඳහා මේ වනවිට භාවිතා කරනු ලබන ටයර් සහ ටියුබ්වල ගුණාත්මකභාවය ප්‍රමාණවත් වන්නේද;

(iii) මේ වනවිට මිලදී ගනු ලබන ටයර් සහ ටියුබ් හේතුවෙන් විදේශ විනිමය වැය වන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන ටයර් සහ ටියුබ් භාවිතා කිරීමට හැකියාවක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1505/2025

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත යටතට අයත්වන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් සම්බන්ධයෙන් භුක්තියේ පදිංචි අයිතිය සඳහා බලය පැවරීමේ ක්‍රමවේදය කවරේද;

(iii) අදාළ විහාරස්ථානයේ/දේවාලයේ හිමිවරුන්ගේ/භාරකරුවන්ගේ අභිමතය පරිදි මෙම ඉඩම් කුලී පදනම, බදු පදනම හෝ සින්නක්කර පදනම මත තෙවන පාර්ශ්වයකට පැවරීම/විකිණීම සිදුකළ හැකිද;

(iv) එසේ නම්, ඊට අදාළ පදනම කවරේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vi) විකුණන ලද හෝ පවරන ලද ඉහත ඉඩම්වල අයිතිය නැවත අදාළ විහාරස්ථානයට/දේවාලයට පැවරෙන්නේද;

(vii) ඉහත ඉඩම් සම්බන්ධයෙන් ඉදිරියේදී පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේද;

(viii) එසේ නම්, එම ප්‍රතිපත්තිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 නොවැම්බර් 24 සඳුදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1272/2025

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ස්ථාපිත කර ඇති ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපනය කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ශික්ෂණ රෝහලක් ස්ථාපනය කිරීමේ අරමුණු කවරේද;

(iv) එම රෝහලක තිබිය යුතු ප්‍රධාන පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සෑම ශික්ෂණ රෝහලකටම වෛද්‍ය පීඨයක් අනුබද්ධ කර තිබේද;

(ii) එම සෑම ශික්ෂණ රෝහලකම මහාචාර්ය ඒකකයක් පිහිටුවා තිබේද;

(iii) මහාචාර්ය ඒකකයක් පිහිටුවා ඇති සහ නොමැති ශික්ෂණ රෝහල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම රෝහල්වලට අනුබද්ධ කර ඇති වෛද්‍ය පීඨ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) කුලියාපිටිය රෝහල, ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමේදී, වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය සිසුන්ගේ සායනික පුහුණුව සඳහා මහාචාර්ය ඒකකයක් ස්ථාපිත කිරීමට අදහස් කර තිබුණේද;

(vi) එසේ නම්, එම ඒකකය ඉදිරියේදී ස්ථාපනය කරන්නේද;

(vii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(viii) කුලියාපිටිය ශික්ෂණ රෝහල සඳහා වර්තමාන රජය විසින් ලබාදී ඇති පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1348/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II සහ III යන එක් එක් ශ්‍රේණියේ මේ වනවිට සේවය කරනු ලබන සංඛ්‍යාව සහ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2025.09.30 දින වනවිට වයස අවුරුදු 57 සම්පූර්ණ කරන ලද විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉහත සඳහන් එක් එක් ශ්‍රේණිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට වැඩ ආවරණය කරනු ලබන ශ්‍රේණිධාරී නොවන විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් සුදුසුකම් අනුව අදාළ ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1396/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990 දශකය වනවිටත් ගොවිතැන් කටයුතු සිදු කරන ලද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගන්නා ලද, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළු අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පාරම්පරික ඉඩම් පසුගිය රජය විසින් අදාළ පාර්ශ්ව වෙත නිදහස් කිරීම සඳහා මූලික පියවර ගනු ලැබූ බව දන්නේද;

(ii) එසේ නම්, ආමවට්ටුවාන්, බේගාමම්, පල්ලියඩිවට්ටෙයි, කිරාන්කෝවයි, පාලයියඩිවට්ටෙයි, කුම්මාවෙලි, කාට්ටුමඩු සහ තුක්කොල්ලයි යන ගම්මානවල ඇති වී ගොවිතැන් කරනු ලබන කුඹුරු ඉඩම්, අදාළ පුද්ගලයන්ට නිදහස් කිරීමට පියවර ගන්නේද;

(iii) ඒ තුළින් ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය ඉහළ නැංවීමට එම පුද්ගලයන්ගේ දායකත්වය ලබා ගැනීමට පියවර ගන්නේද;

(iv) ඉහත කුඹුරු ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග, වාරිමාර්ග කාණු පද්ධති, බෝක්කු සහ කුඩා පාලම් ආදිය ඉදිකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1504/2025

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය තාක්ෂණ විද්‍යාලයේ බොහෝ ගොඩනැගිලි කඩා වැටීමේ අවදානමට ලක්ව ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා ප්‍රතිසංස්කරණය කිරීමට හෝ නව ගොඩනැගිලි ඉදිකිරීමට ගන්නා කඩිනම් පියවර කවරේද;

(iii) යාපනය සහ වවුනියාව තාක්ෂණ විද්‍යාලවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට මෙම වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසර 30ක් පමණ පැරණි තාක්ෂණය මත පදනම්වූ මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ පාඨමාලා සඳහා දෙමුහුන් හෝ නවීන වාහනවල තාක්ෂණික ක්‍රම එක් නොකිරීමට හේතු කවරේද;

(ii) වර්තමාන ප්‍රමිතීන්ට අනුකූලව එම පාඨමාලාවල විෂය නිර්දේශ සංශෝධනය කරනු ලබන දිනය කවරේද;

(iii) මැහුම් පුහුණු මධ්‍යස්ථාන ඇතුළු නවීන යන්ත්‍රෝපකරණ නොමැති තාක්ෂණික විද්‍යාලවලට ඒවා ලබා දීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) තාක්ෂණ විද්‍යාලවල සුදුසුකම්ලත් කථිකාචාර්යවරුන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදු කරන්නේද;

(iii) වෘත්තීය පුහුණු අධ්‍යාපනයේ ගුණාත්මකභාවය දිවයින පුරා සම මට්ටමක පවතින බව සහතික කරනු ලබන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1553/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති අධ්‍යාපන කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) එම කලාප කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තිබෙන පාසැල් වාර්ගිකත්වය අනුව අධ්‍යාපන කලාප තුනකට බෙදා ඇති බවත්;

(ii) මුස්ලිම් පාසැල් කින්නියා අධ්‍යාපන කලාපයටත්, දෙමළ පාසැල් ත්‍රිකුණාමලය අධ්‍යාපන කලාපයටත් සහ සිංහල පාසැල් කන්තලේ අධ්‍යාපන කලාපයටත් සම්බන්ධ කර ඇති බවත්;

(iii) ත්‍රිකුණාමලය අධ්‍යාපන කලාපයේ කුච්චවෙලි කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය යටතේ තිබෙන බොහෝ පාසැල් කලාප අධ්‍යාපන කාර්යාලයේ සිට කිලෝමීටර් 50 කට අධික දුරින් පිහිටා ඇති බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) ත්‍රිකුණාමලය අධ්‍යාපන කලාපයේ භූගෝලීය දුර සහ තඹලගමුව ප්‍රදේශයේ පාසැල් වාර්ගික පදනමින් වෙන් කර තිබීම සැලකිල්ලට ගෙන, අනාගතයේදී නව අධ්‍යාපන කලාප ඇති කිරීමේදී මෙම ප්‍රදේශ සඳහා වෙනම අධ්‍යාපන කලාප ඇති කිරීමට පියවර ගන්නේද, යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 25 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1435/2025

ගරු ඔෂානි උමංගා මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට අර්ථසාධක අරමුදලේ ශේෂය සහ දායක මුදල් ගිණුම්ගත වීම ආදී තොරතුරු මාර්ගගත ක්‍රමය ඔස්සේ දැන ගැනීමට හැකි ක්‍රමවේදයක් තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රමවේදය ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iv) අරමුදලේ සාමාජිකයන්ට ස්වයංක්‍රීය උත්පාදන පණිවිඩ (Auto Generated Messages) යැවීමේ ක්‍රමවේදයක් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ අවධානය යොමුවී තිබේද;

(v) එසේ නම්, එලෙස අවධානය යොමුවී ඇති ක්ෂේත්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1464/2025

ගරු අම්බිකා සාමුවෙල් මෙනෙවිය,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික තරුණ සේවා සභාව විසින් දෙමළ භාෂා මාධ්‍යයෙන් පුහුණු මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලබන්නේද;

(ii) එසේ නම්, එම පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුහුණු මධ්‍යස්ථාන කවරේද;

(iv) ඒවා අතරින් දෙමළ භාෂා මාධ්‍යයෙන් පවත්වා ගෙන යනු ලබන පුහුණු මධ්‍යස්ථාන කවරේද;

(v) ඉහත පුහුණු මධ්‍යස්ථානවල පවත්වනු ලබන පාඨමාලා කවරේද;

(vi) එම මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1498/2025

ගරු බී. ආරියවංශ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම රජය යටතේ සහ පළාත් සභාව යටතේ පාලනය වන රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල්වල නම් කවරේද;

(iii) එම එක් එක් රෝහලේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) රත්නපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම රජය යටතේ පාලනය වන රෝහල්වල ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1539/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළණි ගඟ හරහා ඇති, වර්ෂ 120ක් පමණ පැරණි, යටියන්තොට, ගරාගොඩ පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීම සඳහා ගිවිසුම්ගත වී ඇති කාලය කොපමණද;

(ii) 2023 සැප්තැම්බර් මාසයේ පමණ සිට වාහන ධාවනය සීමා කරමින් එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇති අතර ඒ හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවයකට පත් වී සිටින බව දන්නේද;

(iii) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රමාද වීමට හේතු කවරේද;

(iv) ඉහත පාලම ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ලබා දීමේදී, නිසි ක්‍රමවේද අනුගමනය කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vi) ගිවිසුම්ගත කොන්ත්‍රාත් සමාගම අදාළ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර තිබේද;

(vii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(viii) ඉහත පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1561/2025

ගරු කේ. ඉලංකුමරන් මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය තික්කම් ස්කාගාරය අක්‍රිය වීම හේතුවෙන් පෙබරවාරි සිට අගෝස්තු දක්වා අධික වශයෙන් නිෂ්පාදනය වන තල් රා අපතේ යන බව දන්නේද;

(ii) එසේ නම්, එය නවීකරණය කර නැවත සක්‍රිය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩලය 2016.06.28 දින රු.මි. 112.5ක් අනුමත කර තිබේද;

(iv) ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(v) එය අවසන් කිරීමට අපේක්ෂා කරන දින වකවානු කවරේද;

(vi) ස්කාගාරය නවීකරණය කිරීමෙන් උතුරු පළාතේ තල් රා නිෂ්පාදකයින්ට සහ තල් සංවර්ධන සමුපකාර සමිතිවලට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

(vii) එමඟින් රැකියා, ආදායම සහ අපනයන ක්ෂේත්‍රවල දියුණුව ඇතිවන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අතිරික්ත තල් රා, තල් රා යුෂ, සර්ජිකල් ස්ප්‍රීතු සහ වෙනත් අගය එකතු කළ නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමට පියවර ගෙන තිබේද;

(ii) උතුරු හා නැගෙනහිර පළාත්වල කුඩා පරිමාණ තල් රා සැපයුම්කරුවන් සහ තල් ආශ්‍රිත නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 26 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

21/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේ සිට මේ දක්වා රැකියා සඳහා විදේශ ගතවූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් විදේශ ගත වූ රටවල් කවරේද;

(iii) එම කාල සීමාව තුළ විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබුණු මුළු විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ගේ සුභසාධනය සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

116/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය යහපාලන රජය සමයේ සිදු වූ මහ බැංකු බැඳුම්කර වංචාවක් සම්බන්ධයෙන් සමාජයේ විශාල කතිකාවක් ඇති වූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව මගින් චෝදනා එල්ල කරන ලද පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම බැඳුම්කර වංචාව හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු වූ බලපෑම කවරේද;

(iv) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

347/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්දාරුමූලෙයි දුම්රිය ස්ථානය පිහිටා ඇති බවත්;

(ii) සාමාන්‍ය දුම්රිය පමණක් එම දුම්රිය ස්ථානයේ නවත්වන අතර සීඝ්‍රගාමී දුම්රිය නොනවත්වන බවත්;

(iii) ඉහත දුම්රිය ස්ථානයේ සීඝ්‍රගාමී දුම්රිය නැවැත්වීමට කටයුතු කරන්නේ නම්, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන්ට මෙන්ම වන්දාරුමූලෙයි, පලාච්චෝලෙයි, කොම්මාන්තුරෙයි, ඔරුමුළච්චෝලෙයි, කළුවන්කේනි, මාවඩිවෙම්බු, සිත්තාණ්ඩි සහ චෙංගලඩි යන ගම්මානවල පදිංචි ජනතාවටද ප්‍රතිලාභ ලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම දුම්රිය ස්ථානයේ සීඝ්‍රගාමී දුම්රිය නැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

563/2025

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ, මීවැල්ලෑව, ‘සේනකපුර යාය’ නමින් අමුණක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම අමුණ ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම අමුණ තුළින් ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අමුණ මඟින් ජලය ලබා දෙන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එම අමුණ හේතුවෙන් මේ වනවිට කුඹුරුවලට වැලි පිරීම හේතුවෙන් ගොවීන් දුෂ්කරතාවයට පත්වී සිටින බව දන්නේද;

(vi) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

625/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික පාසැල්වල සහ පළාත් සභා පාසැල්වල මේ වනවිට සේවය කරනු ලබන කම්කරුවන් සංඛ්‍යාව, එම පාසැල් සඳහා අනුමත කම්කරුවන් සංඛ්‍යාව සහ එම පාසැල්වල මේ වනවිට පවතින කම්කරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික පාසැල්වල කම්කරුවන් අතිරික්තයක් පවතින විට පළාත් සභා පාසැල්වල කම්කරු පුරප්පාඩු පැවතීමට හේතු කවරේද;

(iii) රජයේ පාසැල් පද්ධතිය තුළ කම්කරුවන් නිසි පරිදි ස්ථානගත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 27 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

207/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, — අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(ii) වර්ෂ 2020 සිට 2025 දක්වා පාසැල්වල හා මධ්‍යස්ථානවල ඉතිරිව තිබූ, නොබෙදූ පාසැල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව සහ නැවත භාවිතා කළ හැකිව තිබූ පාසැල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසැල් පෙළ පොත්වල මූල්‍යමය වටිනාකම කොපමණද;

(iv) පාසැල් පෙළ පොත් භාවිතය අවම මට්ටමක පැවති, 2021 වර්ෂයේ පාසැල් පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) පාසැල් පෙළ පොත් නියමිත වේලාවට ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

228/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ, දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටුවන ලද නීතිය කවරේද;

(ii) එම අධිකරණයේ කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම අධිකරණයේ මේ වනවිට විභාග කරනු ලබන නඩු සංඛ්‍යාව සහ එම අධිකරණය මඟින් විභාග කර අවසන් කරන ලද නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා එම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු කටයුතු ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම අකර්මන්‍ය වී ඇති බව පිළිගන්නේද;

(ii) අල්ලස්, මූල්‍ය අපරාධ සහ මූල්‍ය දූෂණ සම්බන්ධයෙන් වූ නඩු කඩිනමින් විභාග කර අවසන් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

315/2024

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ —

(i) 2024.12.31 දිනට මුළු ණය ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් සහ එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2021 සිට 2024 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයට අදාළ මුළු ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2024.12.31 දිනට මුළු ණය ප්‍රමාණය දේශීය ණය සහ විදේශීය ණය වශයෙන් බෙදී යන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බහුපාර්ශ්වික ණය, ද්විපාර්ශ්වික ණය, ජාත්‍යන්තර ස්වෛරී ණය සහ වාණිජ ණය ලෙස වර්ගීකරණය කළ විට 2024.12.31 දිනට විදේශ ණය සංයුතිය කවරේද;

(v) 2020 සිට 2024 දක්වා කාලය තුළ විදේශ ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2024.12.31 දිනට මුළු බහුපාර්ශ්වික ණය ප්‍රමාණය කොපමණද;

(vii) ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහාවූ ජපාන බැංකුව සහ අයර්ලන්ත මිත්‍ර බැංකුව වෙතින් ලබාගත් බහුපාර්ශ්වික ණය ප්‍රමාණය 2020 සිට 2024 දක්වා කාලයට අදාළව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) 2024.12.31 දිනට මුළු ද්විපාර්ශ්වික ණය ප්‍රමාණය කොපමණද;

(ix) 2020 සිට 2024 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයට අදාළ මුළු ද්විපාර්ශ්වික ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

552/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා ඩිජිටල් හැඳුනුම්පතක් හඳුන්වා දෙන්නේද;

(ii) ඩිජිටල් හැඳුනුම්පත භාවිතයේ වාසි කවරේද;

(iii) එම හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රමවේදය කවරේද;

(iv) එක් හැඳුනුම්පතක් සකස් කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(v) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා එම හැඳුනුම්පත සකස් කිරීමට වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඩිජිටල් හැඳුනුම්පත හඳුන්වා දීම සඳහා අරමුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(ii) ඒ සඳහා විදේශ ණය හෝ ආධාර ලබා ගන්නේ නම්, එම ණය/ආධාර ලබා දෙන රට හෝ ආයතන කවරේද;

(iii) එම හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලියට මුදල් ආයෝජනය කරන ආයෝජකයන්ට ලබා දෙන ප්‍රතිලාභ කවරේද;

(iv) එම ආයෝජකයන්ට පුද්ගලයන්ගේ දත්ත ලබා ගත නොහැකි බවට සහතික වන්නේද;

(v) ඩිජිටල් හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන සියලුම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1262/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාහන ආනයනය කිරීමේ නීති ලිහිල් කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවට මේ වනවිට ආනයනය කර ඇති BYD වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතරින් මේ වනවිට ශ්‍රී ලංකා රේගුවෙන් මුදාහැර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම වාහන සංඛ්‍යාව ඒවායේ එන්ජින් ධාරිතාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එන්ජින් ධාරිතාවය කිලෝ වොට් 100 සහ එන්ජින් ධාරිතාවය කිලෝ වොට් 150 අනුව අය කරනු ලබන තීරු බදුවල වෙනස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?